උමර් ඉබ්නු කත්තාබ් (රළියල්ලාහු අන්හු) තුමා සමග අවුරුදු සලාතයට මම සහභාගී වූයෙමි. එවිට එතුමා “මෙම දින දෙක, එනම් නුඹලාගේ උපවාසයෙන් නුඹලා අවසන් කර ගන්නා (ඊදුල් ෆිත්ර්) දින හා නුඹලාගේ සත්ව කැපයෙන් නුඹලා අනුභව කරන (ඊදුල් අල්හා) දින යන දෙදින උපවාසයේ නිරත වීම අල්ලාහ්ගේ දූතයාණන් තහනම් කර ඇත.”

ඉබ්නු අස්හර්ගේ සේවකයකු වූ අබූ උබෙයිද් තුමා විසින් වාර්තා කරන ලදී: උමර් ඉබ්නු කත්තාබ් (රළියල්ලාහු අන්හු) තුමා සමග අවුරුදු සලාතයට මම සහභාගී වූයෙමි. එවිට එතුමා
“මෙම දින දෙක, එනම් නුඹලාගේ උපවාසයෙන් නුඹලා අවසන් කර ගන්නා (ඊදුල් ෆිත්ර්) දින හා නුඹලාගේ සත්ව කැපයෙන් නුඹලා අනුභව කරන (ඊදුල් අල්හා) දින යන දෙදින උපවාසයේ නිරත
වීම අල්ලාහ්ගේ දූතයාණන් තහනම් කර ඇත.” [صحيح] [متفق عليه]

ඊදුල් ෆිත්ර් හෙවත් උපවාසයෙන් පසු සමරන උත්සවය හා ඊදුල් අළ්හා හෙවත් හජ් උත්සවය යන දෙදින උපවාසයේ නිරතවීම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ වැළැක්වූහ. ඊදුල් ෆිත්ර් යනු රමළාන් මාසයේ උපවාසයෙන් මිදෙන දිනයයි. ඊදුල් අළ්හා යනු උල්හිය්යා නම් සත්වයන් කැප කොට එමගින් අනුභව කරන දිනයයි.

https://sunnah.global/hadeeth/si/show/4527